**සී/ස රක්නා ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් සමාගම - 2022/ 2023**
--------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අභිතකර මතය

සීමාසහිත රක්නා ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් සමාගමේ 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන් සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 අභිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ අභිතකර මතය විස්තර කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අභිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි සමාගමේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක බව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සමාගම සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සමාගම සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ ගෙවීම් පාලන ක්‍රමවේදය හා අභ්‍යන්තර පාලන ක්‍රියා මාර්ග අනුව, සියලුම චෙක්පත්/මුදල් ගෙවීම් සම්බන්ධව භාරගත් පුද්ගලයාගේ නම, අත්සන සහ දිනය වවුචරය තුළ නිසි ලෙස සටහන් කළ යුතු වුවද රු.250,087 ක වටිනාකමකින් යුත් වවුචර් සකස් කිරීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි නිරීක්ෂණ උද්ගත නොවන පරිදි ප්‍රේෂණපත් නිකුත් කිරීම නිසි ක්‍රමවේදයට අනුව සිදු කරන ලෙසට අදාළ කාර්ය මණ්ඩලය වෙත උපදෙස් ලබාදී ඇති බව | ගෙවීම් කිරීමට අදාල අභ්‍යන්තර පාලන ක්‍රමවේද නිසි පරිදි අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාගමේ ගෙවීම් පාලන ක්‍රමවේදය හා අභ්‍යන්තර පාලන ක්‍රියා මාර්ග අනුව, සියලුම ගෙවීම් වලට අදාලව බලයලත් නිළධාරීන් විසින් ගෙවීම අනුමත කිරීම සහ ගෙවීම සහතික කිරීම සඳහා අත්සන් යෙදීම අනිවාර්ය වේ. නමුත් රු.283,065 ක වටිනාකමකින් යුත් වවුචර් සකස් කිරීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. | සමාගමේ සියලුම ගෙවීම් අදාළ බලයලත් නිලධාරීන්ගේ නිසි අනුමැතිය සහ සහතික කිරීම මත සිදුකරන අතර නිරීක්ෂණය මගින් පෙන්වාදී ඇති ගෙවීම් වවුචර් අදාළ බලයලත් නිලධාරීන්ගේ අතපසුවීම මත සිදුව ඇත. ඉදිරියේදී මෙවැනි නිරීක්ෂණ උද්ගත නොවන පරිදි කටයුතු කරන බව, | ගෙවීම් සිදු කිරීමේදී සහතික කිරීම හා අනුමත කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට කටයුතු කළ යුතු බව. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් කාලපරිච්ඡේදයට අදාල රු.334,098 කින් යුත් වාහන කුලී, නඩත්තු වියදම්, ඉඩම් කුලී, ප්‍රවාහන වියදම් ආදිය ප්‍රවර්තන වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2021/2022 මූල්‍ය වර්ෂයට අදාල බිල්පත් 2022/23 මූල්‍ය වර්ෂයේදී මූල්‍ය අංශය වෙත ලැබී තිබු බැවින් 2022/23 මූල්‍ය වර්ෂයේදී වියදමක් ලෙස ගිණුම්ගත කර ඇති බව. | කාලපරිච්ඡේදයට අදාල වියදම් නිසි ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 අප්‍රේල් 01 සිට ජුනි 30 දක්වා කම්කරු වැටුප් රු.497,595 ක් ද, කම්කරුවන් සඳහා උත්සව දීමනා ලෙස රු.30,000 ක් ද වශයෙන් එකතුව රු.527,595 ක වියදමක් සහ කාර්යාල කාර්යය මණ්ඩල වැටුප් හා දීමනා ලෙස රු.457,650 ක් මව් සමාගම විසින් දරා ඇති මුත් සමාලෝචිත මූල්‍ය කාල පරිච්ඡේදයට අදාලව පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශනවල වර්ෂයට අදාලව දරන ලද රු.332,779 ක කම්කරු වැටුප් හා උත්සව දීමනා වියදමක්ද රු.457,650 ක් වූ කාර්ය මණ්ඩල වැටුප් හා දීමනාද ඇතුළත් කර නොතිබූ අතර ඒ පිළිබඳ හෙළිදරව් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | කාලපරිච්ඡේදයට අදාළ සමස්ථ කම්කරු වැටුප් වියදම වූ රු.497,595 කින් රු.302,779 ක් විෂය ලිපිකරුගේ අත්වැරදීමකින් ගොඩබිම් මෙහෙයුම් අංශයේ වැටුප් ලෙස ගිණුම්ගත කර ඇත. සමාගමේ (RPML) කාර්ය මණ්ඩලය ලෙස සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගමේ තැනැත්තන් අනුයුක්තකර තිබූ බැවින් ඔවුන්ගේ වැටුප් රක්නා ආරක්ෂක ලංකා සමාගමේ වැටුප් වශයෙන් ගිණුම්ගතකර ඇත. තවද සීමා සහිත රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සහ රක්නා ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් සමාගමේ 2023/2022 මූල්‍ය වාර්තාවන්ට මෙමගින් බලපෑමක් සිදුවුවත් රක්නා සමූහයේ 2023/2022 මූල්‍ය වාර්තාවන්ට එමගින් බලපෑමක් සිදු වී නැති බව. | මෙහෙයුම් වලට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන තුළ අන්තර්ගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීමට බදු පෙර ලාභය පදනම් කර ගන්නා බව මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ දක්වා තිබුණද බදු පසු ලාභය පදනම් කර ගණනය කර තිබුණි. | 2023/ 2024 මූල්‍ය වර්ෂයට අදාළ මූල්‍ය වාර්තාවල ඇතුළත් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී බදු පෙර ලාභය පදනම්ව සකස් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය. |

### 1.5.3 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 ජුලි 07 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි කළමනාකාරිත්වය සමාගමේ ක්‍රියාකාරිත්වය නවතා දමා ඇති බැවින්, සමාගම අඛණ්ඩ පැවැත්මක් සහිත සමාගමක් නොවන බවට පදනම මත මූල්‍ය | 2022/2023 මූල්‍ය වර්තා සකස්කර විගණනයට භාරදීමට කටයුතු කරන අවස්ථාව වන විටත් සීමාසහිත රක්නා ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් ලිමිටඩ් (RPML) ඈවර කිරීමට අවශ්‍ය අධ්‍යක්ෂ | මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇති හෙළිදරව් කිරීම් වලට අදාලව කටයුතු කළ |

ප්‍රකාශන සකස්කර ඇති බව පෙන්නුම් කරන මූල්‍ය ප්‍රකාශනවල 2.8 සටහන අනුව සමාගමේ ක්‍රියාකාරීත්වය අත්හිටුවීමෙන් පසුව සමාගම අඛණ්ඩ පැවැත්මක් සහිත සමාගමක් ලෙස දිගටම කරගෙන යාමට ඇති නොහැකියාව තහවුරු කරන ලද තක්සේරුවක් සිදුකර ඇත. තවද, 2023 ජුනි 20 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණයකට අනුව, 2022 /2023 මූල්‍ය වර්ෂ සඳහා ව්‍යවස්ථාපිත විගණනය අවසන් වූ පසු සමාගම ඇවර කිරීම ආරම්භ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. එබැවින් මූල්‍ය ප්‍රකාශන අදාළ මූල්‍ය වාර්තාකරණයට අනුකූලව ඇවර කිරීමේ පදනම මත සකස්කර තිබුණි.

මණ්ඩල අනුමැතිය ලැබී තිබූ බැවින් මූල්‍ය යුතුය. වාර්තා සකස් කිරීමේදී ඇවර කිරීමේ පදනම මත සිදුකර ඇති බව.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2007 අංක 7 දරන සමාගම් පනත | | | |
| | (i) 150(1) වගන්තිය | ශේෂ පත්‍ර දිනෙන් මාස 06 ක් ඇතුළත හෝ සමාගම් රෙජිස්ටාර් විසින් නිශ්චය කර දීර්ඝ කරනු ලබන කාලපරිච්ඡේදය තුළ සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම කළමණාකරනය විසින් සිදු කළ යුතු වුවත් 2023 මාර්තු 31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදයට අදාල මූල්‍ය ප්‍රකාශන ශේෂ පත්‍ර දිනය අවසන් වී මාස 06 ක් ඇතුළත හෝ සමාගම් රෙජිස්ටාර් විසින් නිශ්චය කර දීර්ඝ කරනු ලබන කාලපරිච්ඡේදය තුළ පිළියෙල කර නොතිබුණි. | 2021/22 මූල්‍ය වර්ෂයන්ට අදාළ මූල්‍ය ප්‍රකාශන නියමිත කාලවකවානු ඇතුළත සකස්කර විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඊට පසු සිදුකළ යුතු ඉදිරි සියලු ක්‍රියාදාමයන් ප්‍රමාදවීම වලක්වා ගැනීමට නොහැකිවීම මත 2022/23 මූල්‍ය ප්‍රකාශනද අපේක්ෂිත දිනට ප්‍රථම විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකීවී ඇති බවත්, එය දීර්ඝකර ගැනීමට සමාගම් රෙජිස්ටාර් වෙතින් අනුමැතියක් ලබාගත යුතු වුවත් සමාගම විසින් ඒ අනුව කටයුතුකර නැති බව. | පනතේ සඳහන් විධි විධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| | (ii) 220 වගන්තිය | සමාගමක ශුද්ධ වත්කම් ඒ සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් හරි අඩකට වඩා අඩු බව පෙනී යන | සමාගමේ සියයට 100 ක කොටස් හිමිකාරිත්වය මව් සමාගම (RALL) සතු වන අතර සමාගම් දෙකෙහිම | සමාගම් පනතේ සඳහන් විධි විධාන ප්‍රකාරව |

| | | | | |
|---|---|---|---|---|
| | | අවස්ථාවකදී සමාගමට දැරීමට සිදුවී ඇති පාඩුවල ස්වභාවය හා ප්‍රමාණය, පාඩුවට හේතුව සහ එවැනි පාඩු තවදුරටත් සිදුවීම වැලැක්වීම සඳහා හෝ දැරීමට සිදු වූ පාඩු පිරිමසා ගැනීම සඳහා හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගෙන ඇති පියවර පිළිබඳ කොටස් හිමියන්ට දැනුම් දීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්තාවක් පිළියෙල කර එම වාර්තාව සමඟ ඒ සමාගමේ කොටස් හිමියන්ගේ අතිවිශේෂ මහා සභා රැස්වීමක් ඒ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කැඳවනු ලැබිය යුතු වුවත් සමාගම සමාලෝචිත වර්ෂය තුළදී ශුද්ධ වත්කම් වල අගය රු.මිලියන 2.518 ක සෘණ වටිනාකමක් වී තිබුණද එකී රෙගුලාසි ප්‍රකාරව වාර්තාවක් පිළියෙල කිරීමට හෝ රැස්වීමක් කැඳවීමට කටයුතු කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලය එකක් වන බැවින් සමාගමට උද්ගතව ඇති මෙම තත්ත්වය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලද නිරන්තර සාකච්ඡාවට ලක් කරනු ලැබේ. RPML සමාගම සමාගම් පනතේ ප්‍රතිපාදනයන්ට අනුකූලව වසා දැමීම සඳහා එම සමාගමේ විගණනය කරන ලද ගිණුම් වාර්තා (Audited Accounts) අවශ්‍ය අතර විගණනය කරන ලද 2022/2023 ගිණුම් වාර්තා (Audited Accounts) ලද පසු RPML කොටස් හිමිකරු වන RALL සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාදෙන ලද උපදෙස් පරිදි වසාදැමීමට අවශ්‍ය ඉදිරි කටයුතු නොපමාව සිදුකිරීමට නියමිතව ඇති බව. | වාර්තාවක් පිළියෙල කිරීමට හා රැස්වීමක් කැඳවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 අංක 19 දරන විගණන පනතේ 16(1) හා 16(2) වගන්තිය | නිසි පරිදි වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ගිණුම් වාර්තා හා පොත්පත් පවත්වාගෙන යා යුතු බවත්, අදාළ නෛතික අවශ්‍යතාවයන්හි දක්වා ඇති කාලසීමාව තුළදී විගණකාධිපති වෙත විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතු බවත් දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ වසර 02 කුත් මාස 06 ක් ගතවීමෙන් පසු 2025 ඔක්තොබර් 22 දින දීය. | 2018 අංක 19 දරන විගණන පනතේ 16(1) හා 16(2) වගන්තිය ප්‍රකාරව 2021/2022 මූල්‍ය වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන නියමිත කාලවකවානු ඇතුළත සකස්කර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් ඊට පසු සිදුකළ යුතු සියලුම ඉදිරි ක්‍රියාදාමයන් ප්‍රමාදවීම වළක්වා ගැනීමට නොහැකිවීම මත 2022/2023 මූල්‍ය ප්‍රකාශනද අපේක්ෂිත දිනට ප්‍රථම විගණනය සඳහා ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති බව. | ජාතික විගණන පනතේ සඳහන් විධි විධාන ප්‍රකාරව නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 131,910 බදු පසු ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පාඩුව රු. 2,650,628 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,782,538 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.848,573 ක ප්‍රමාණයකින් එනම් සියයට 419 කින් ඉහලයාම සහ රු. 776,200 ක ප්‍රමාණයක වෙනත් ආදායම් උපයාගෙන තිබීම හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත කාල පරිච්ඡේදයේ සමාගමේ ආදායම පෙර කාල පරිච්ඡේදයට සාපේක්ෂව රු. 202,161 ක වටිනාකමක සිට රු. 1,050,734 ක් දක්වා සියයට 419 කින් ඉහළ ගොස් තිබූ අතර රු. 776,200 ක ප්‍රමාණයක වෙනත් ආදායම් උපයාගෙන තිබුණි. පරිපාලන වියදම් පෙර කාල පරිච්ඡේදයට සාපේක්ෂව රු. 2,029,365 ක වටිනාකමක සිට රු. 1,138,982 ක් දක්වා සියයට 43.8 කින් පහළ ගොස් තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 ජුනි 15 දින රක්නා ආරක්ෂක ලංකා සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර තිබූ යෝජනා සම්මුතියේ 1.10 ඡේදයේ දැක්වෙන පරිදි එවකට රටේ පැවති කාබනික පොහොර හිඟයට පිළියමක් ලෙස කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් කඩිනමින් ආරම්භ කරන ලෙසට ජනාධිපති කාර්ය සාධක බලකාය මගින් දැනුම් දී ඇති බව දක්වා තිබුණි. අනතුරුව කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය සඳහා රක්නා ප්‍රොජෙක්ට් මැනේජ්මන්ට් සමාගම (RPML) පිහිටුවා තිබූ අතර සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ අරමුණු කිසිවක් දක්වා නොතිබූ නමුත් කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂාවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අත්සන් කරන ලද යෝජනා සම්මුතියක් පමණක් ඇතුලත් කිරීමෙන් මෙම ව්‍යාපෘතිය ආරම්භකර තිබුණි. කාබනික පොහාර නිෂ්පාදන කටයුතු වලින් පසු 2023 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව මුළු ශුද්ධ | කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සඳහා සමාගම පිහිටුවා ඇති අතර සමාගම ආරම්භයේදී සිදුකළ යුතු ක්‍රියාපිළිවෙත අනුගමනය නොකිරීම සම්බන්ධව කරුණු පැහැදිලි කිරීමට අවශ්‍ය තොරතුරු මේ වනවිට සමාගම සතුව දැනට පවතින ලිපිගොනු තුළ නොමැති බැවින් කරුණු පැහැදිළි කිරීමට හැකියාවක් නොමැත. 2022 ජුලි 07 දින සමාගම (RPML) වසාදැමීමක් සිදුකර නොමැති අතර ජාතික අයවැය චක්‍රලේඛ 3/2022 යටතේ සඳහන් උපදෙස් පිළිපදිමින් 2022 ජුලි 07 දින සිට ව්‍යාපෘතියේ සියලු ක්‍රියාකාරකම් පමණක් අත්හිටුවීමට කටයුතුකර ඇත. 2023 ජුනි 30 දින පැවති 153 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගම නිත්‍යානුකූලව (RPML) වසා දැමීමට ඉදිරි කටයුතු සිදුකරන ලෙසට අනුමැතිය ලබාදී ඇත. 2022/2023 විගණිත ගිණුම් වාර්තා (Audited | විධිමත් ක්‍රියාමාර්ගවලින් බැහැරව RPML සමාගම පිහිටුවීම හා එහි අසාර්ථකවීම සම්බන්ධයෙන් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට කටයුතු කළ යුතුය. |

වත්කම් රු.මිලියන 2.518 ක සෘණ අගයක් ගෙන ඇති අතර 2022 ජුලි 07 දින සමාගමේ කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියේ සියළු ක්‍රියාකාරකම් නවතා දමා තිබුණි.

Accounts) ලද පසු සමාගම වසාදැමීමට අදාළ ඉදිරි කටයුතු සිදු කිරිමට නියමිතව ඇති බව.